උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2015

------------------------------------------------------

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘති කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකීම දරයි. උතුරු හා උතුරු මැද පළාත්වල ජාතික මාර්ග කිලෝමීටර් 170 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ආරම්භක ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,980 කට සමාන එජඩො මිලියන 146 ක් වන අතර රු.මිලියන 14,950 කට සමාන එජඩො මිලියන 130 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, උතුරු හා උතුරු මැද පළාත්වල දළ වශයෙන් කිලෝමීටර් 288 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් 2013 මැයි 31 දිනැති අංක 2890 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය යටතේ රු.මිලියන 8,840 කට සමාන එජඩො මිලියන 68 ක් හා 2013 මැයි 31 දිනැති අංක 2891 එස්ආර්අයි දරන ණය යටතේ රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක අතිරේක මූල්‍යයනයක් වෙන්කර තිබුණි. ආරම්භක ණය ගිවිසුම යටතේ ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ඔක්තෝබර් 22 දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. අතිරේක මූල්‍යයන සැලසුම් යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි 13 දින ආරම්භ කරන ලද අතර 2018 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

රු.මිලියන 47.68 ක පිරිවැයකට උපදේශකවරුන් විසින් ණය මුදල්වලින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම් අදාළ ස්ථාවර වත්කම් යටතේ වෙනම දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 5.4 වගන්තියට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ට රු.මිලියන 1.68 ක ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයට පටහැනිව, ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් පදනම් කරගෙන රු.මිලියන 23.76 ක වැටුප් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදි හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | | | | | | |
| ණය අංක 2639 - එස්ආර්අයි | 130 | 14,950 | 1,350 | 1,033 | 111.70 | 15,642 |
| ණය අංක 2890 - එස්ආර්අයි (එස්එෆ්) | 68 | 8,840 | 2,500 | 1,376 | 21.92 | 3,070 |
| ණය අංක 2891 - එස්ආර්අයි | 30 | 3,900 | -- | 1,006 | 17.82 | 2,497 |
| ශ්‍රීලංර | 16 | 2,080 | 25 | 15 | 0.42 | 59 |
| | 244 | 29,770 | 3,875 | 3,430 | 151.86 | 21,268 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, උතුරු සහ උතුරු මැද පළාත්වල කිලෝමීටර් 170 ක දිගින් යුතු ජාතික මාර්ග 10 ක පුනරුත්ථාපන වැඩ නිම කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. එබැවින් පුනරුත්ථාපනය කරන ලද ජාතික මාර්ග 03 ක වර්ෂ 3 ක කාර්යසාධන පදනම් නඩත්තු වැඩ ඇතුළත් පැකේජ 10 ක් යටතේ එම මාර්ගවල පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත්තු 2015 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. තවද ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ මාර්ග පුනරුත්ථාපනය මත ඉතිරිකිරීම් යොදා ගනිමින් වෙනත් මාර්ග 2 ක පුනරුත්ථාපනය කිරීම් සඳහා කොන්ත්‍රාත්තු 2015 වර්ෂයේදී ප්‍රදානය කර තිබුණු අතර එම මාර්ගවල පුනරුත්ථාපන වැඩවලින් සියයට 75 කට වැඩි ප්‍රමාණයක් 2015 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. ඊට අමතරව අතිරේක මූල්‍යයන සැලැස්ම යටතේ ප්‍රදානය කර තිබූ උතුරු සහ උතුරු මැද පළාත්වල කිලෝමීටර් 101.63 ක දිගින් යුතු වෙනත් මාර්ග 9 ක පුනරුත්ථාපන වැඩද 2015 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. කැබිතිගොල්ලෑව - පාදෙණිය මාර්ගයේ කිලෝමීටර් 15+500 සිට කිලෝමීටර් 31+345 දක්වා කොටස්වල පුනරුත්ථාපන වැඩ 2015 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ව්‍යාපෘතියේ කාර්යසාධන පදනම් මාර්ග නඩත්තු වැඩ සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත්තු පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරුත්ථාපනය කරන ලද මාර්ගවල කාර්යසාධන පදනම් නඩත්තු වැඩ සඳහා තාක්ෂණික සුදුසුකම්ලත් කාර්ය භාර නිලධාරීන්, මාර්ග නඩත්තු වැඩ අධීක්ෂණය සඳහා පත්කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පැහැදිලි කිරීමට අනුව, පුනරුත්ථාපනය කරන ලද මාර්ගවල කාර්යසාධනය පදනම් නඩත්තු වැඩ සඳහා

ව්‍යාපෘති කළමනාකරුවන් වගකිවයුතු වන අතර, අදාළ කොන්ත්‍රාත්කරුවන්ගේ තාක්ෂණික කාර්ය මණ්ඩලය කාර්යසාධනය පදනම් නඩත්තු වැඩ අධීක්ෂණය සඳහා යොදවා තිබුණි.

(ආ) කාර්යසාධන පදනම් නඩත්තු වැඩ සඳහා පිළිගත් පරිචයන් අනුව, අලුතින් ඉදිකරන ලද මාර්ගවල නඩත්තු වැඩ සඳහා පිරිවැය අවම මට්ටමක පැවතිය යුතුය. එබැවින් කොන්ත්‍රාත්කරුවන් විසින් ඒ සඳහා අඩු රේටයන් ඉදිරිපත් කරනු ලැබේ. කෙසේ වුවද වවුනියා - හොරොව්පතාන මාර්ගය, මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය හා කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ කොටස් නඩත්තු කිරීම සඳහා එම මාර්ගවල පුනරුත්ථාපනය කිරීම්වල යෙදුණු කොන්ත්‍රාත්කරුවන් විසින්ම ලංසු ලියකියවිලිවල අතාත්වික රේටයන් ඉදිරිපත් කර තිබුණි. මාර්ග නඩත්තු වැඩ සඳහා අතාත්වික රේටයන් ඉදිරිපත් කිරීම පිළිබඳ හේතු විමර්ශනය කිරීම වෙනුවට කාර්යසාධන ඇපකරයේ වටිනාකම වැඩි කිරීමට පමණක් ව්‍යාපෘති නියාමන ඒකකය කටයුතු කර තිබුණි.

(ඇ) යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගයේ නඩත්තු වැඩ සඳහා අනුකූල නොවන ගැටලු පිළිබඳ අධීක්ෂණ ඉංජිනේරු විසින් නිකුත් කළ යුතු මාසික නඩත්තු වාර්තාව පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) එජඩො මිලියන 1.13 ක හා රු.මිලියන 194.14 ක පිරිවැයකට පිරිනමන ලද උපදේශක සේවා කොන්ත්‍රාත්තුව එජඩො මිලියන 1.09 ක් හා රු.මිලියන 231.44 ක් ලෙස සංශෝධනය කර තිබූ අතර වවුනියා - හොරොව්පතාන මාර්ගයේ විස්තරාත්මක සැලසුම් හා ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම මත අතිරේක වැඩ, වැඩ විෂය පථය වෙනස් කිරීම සහ ඇස්පල්ට් ඇතිරීම හා ධාරිතා සංවර්ධන කාර්යයන් සඳහා ජාත්‍යන්තර විශේෂඥයින් යෙදවීම ආදී විවිධ කරුණු හේතුවෙන් උපදේශක සේවා කාලය 2015 දෙසැම්බර් 31 දින සිට 2016 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

(ඉ) වවුනියා - හොරොව්පතාන මාර්ගයේ කිලෝමීටර් 22+000 සිට කිලෝමීටර් 34+950 දක්වා පුනරුත්ථාපනය කිරීම් වැඩ පිළිබඳ කොන්ත්‍රාත්තුව නිමකර 2015 අප්‍රේල් 28 දින භාරගෙන තිබුණි. කෙසේ වුවද භාර ගැනීමෙන් පසු රු.මිලියන 7.89 ක පිරිවැයකට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අතිරේක වැඩද සිදු කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි 10.1 වගන්තියේ අවශ්‍ය පරිදි මාර්ග තත්ත්වයන් පිළිබඳ පරීක්ෂාවක් සිදු කිරීමෙන් තොරව මාර්ගය භාර ගෙන තිබූ බව එයින් දැක්වුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පැහැදිලි කිරීමට අනුව, පුද්ගලික නිවැසියන් සඳහා කාණු පද්ධති හා මාර්ග ප්‍රවේශ පහසුකම් සැපයීමට මහජන ඉල්ලීම් කිහිපයක් තිබූ බවත් කොන්ත්‍රාත්තුවේ දෝෂ දැන්වීම් කාලය තුළ එම ඉල්ලීම් සම්පූර්ණ කළ බවත් දන්වා තිබුණි.

(ඊ) රඹෑව සිට මැදවච්චිය දක්වා මහනුවර - යාපනය මාර්ගයේ කොටසක් වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් හා ලංසු ලියකියවිලි පිළියෙල කිරීම, ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ඉතිරි මුදල් යොදා ගනිමින් 2015 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වුවද 2016 මැයි 31 වන විටත් එම කාර්යයන් නිම කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීමට අනුව, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් හූ තාක්ෂණික

අධ්‍යයනයන් සම්පූර්ණ කිරීමට උපදේශකවරයාට නොහැකි වී තිබුණි. ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසන් වීමට පෙර මාර්ගයේ වැඩිදියුණු කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් වැඩ සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි අලුත් පාලම් කිහිපයක ඉදිකිරීම් වැඩ කපා හැරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි.

(උ) මැදවච්චිය - මන්නාරම - තලෙයිමන්නාරම මාර්ගයේ වැඩ විෂය පථය පසුව වෙනස් කර තිබූ අතර ඒ අනුව ඉවුරු හා බෝක්කු ඉදිකිරීම් යටතේ වැඩ මුලින් සැලසුම් කරන ලද වැඩවලට වඩා සියයට 67 කින් හා සියයට 72 කින් වැඩි කර තිබුණි. පොළවේ වැඩ විධිමත් ආකාරයෙන් සිදු කිරීමෙන් තොරව ප්‍රමාණ පත්‍ර පිළියෙල කර තිබූ බව ඒ අනුව පෙනී යයි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීමට අනුව, ජලයට යටවීම් වැළැක්වීම සඳහා ඉවුරුවල වැඩ වැඩි කළ බවත් සමහර බෝක්කුවල අබලන් තත්ත්වය හේතුවෙන් එම බෝක්කු ප්‍රතිසංස්කරණය කළ බවත් දක්වා තිබුණි.

## 3.4 ඉඩම් අත්පත් කරගැනීම හා නැවත පදිංචි කිරීම පිළිබඳ කරුණු

---

යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගයේ පුනරුත්ථාපනය කිරීම් වැඩ සඳහා ඉඩම් කැබලි 206 ක් අත්පත් කරගෙන තිබූ බවත් ඒ සඳහා රු.මිලියන 13.39 ක වන්දි ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද එම ඉඩම්වල අයිතිය 2015 දෙසැම්බර් 31 වන විටත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද පැහැදිලි කිරීමට අනුව, කයිට්ස් ප්‍රදේශයේ ඉඩම් අයිතිකරුවන් වැඩි ප්‍රමාණයක් විදේශවල හෝ කයිට්ස් ප්‍රදේශයෙන් පිට ජීවත්වන අතර ඒ අනුව ඉඩම් අත්පත් කරගැනීම ප්‍රමාද වී තිබුණි.